# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 මාර්තු මස 25 වන දින

## II වන කොටස

## අතිරේකය

## (2022.03.31 දින නිකුත් කරන ලදී)


# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 281 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, මරණීය දණ්ඩනයෙන් දඬුවම් කළ හැකි වරදක් සිදුකරනු ලබන්නා වූ ද එම වරද සිදුකරනු ලබන අවස්ථාවේ වයස අවුරුදු දහඅටට අඩු වන්නා වූ ද තැනැත්තකු සම්බන්ධයෙන් අධිකරණය විසින්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි දණ්ඩනය ප්‍රකාශයට පත්කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 286 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය, 4 වන වගන්තිය මගින් සිදු කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 288 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ දණ්ඩනයක් නියම වූ යම් තැනැත්තකු වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් රඳවා තැබීම සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති යම් ආයතනයක රඳවා තැබීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

එල්.ඩී.-ඕ. 80/2021

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක   දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 281 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 281 වන වගන්තිය, එහි "යම් තැනැත්තකු, වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු බව අධිකරණයට පෙනී ගිය අවස්ථාවක," යන වචන වෙනුවට "යම් තැනැත්තකු, ඒ තැනැත්තා විසින් ඒ වරද සිදුකරන ලද අවස්ථාවේදී ඒ තැනැත්තාගේ වයස අවුරුදු දහඅටට අඩු වන අවස්ථාවක," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 286 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 286 වන වගන්තිය, එහි "මේ වගන්තියේ සහ 288 වන වගන්තියෙහි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ වගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 288 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 288 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ වූ දණ්ඩන නියමයන් ක්‍රියාත්මක කිරීම

288. (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 53 වන වගන්තිය යටතේ යම් තැනැත්තකුට එරෙහිව දණ්ඩනයක් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තා, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තන් රඳවා තැබීම සඳහා යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවා ඇති යම් ආයතනයක, දණ්ඩනයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා ඒ ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව රඳවා තැබිය යුතු ය.".

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව